10 වන පිටෙන්

වශයෙන් වාර්තා පොතට එක්විය. එමෙන්ම කැසට් පටිවලට ආයුබෝවන් කියා සීඩී තැටි වලට අවතීර්ණ වූ අනුව දශකයේද නිෂ්පාදිත මුල්ම සීඩී තැටි අතර එතුමන්ගේ ගීත තැටිද තිබීම ඉතා විශේෂය.

රූපවාහිනියේ ආගමනයත් සමඟම අපට එතුමන්ව නිතරම පුංචි තිරයේ දැක ගත හැකි විය. එකල එතුමන් ගැයූ එපා එපා මස් කන්නට කිරි අම්මාගේ ගීතය ලාංකීය සමාජයේ මුල් බැසගෙන තිබූ එක්තරා පුරුද්දක් වෙනස් කිරීමට සමත් විය. එනම් එම ගීතය ඇසීමෙන් පසු බොහෝ දෙනෙකු ගව මස් ආහාරයට ගැනීම නවතා දැමීමයි. අද කාලයේ එකක් කියා තවඑකක් කරන සමහරුන් මෙන් හක්කෙ බුදු රැස් නමුත් බොක්කෙ දඩ මස් යන න්‍යායය නොව ප්‍රතිපත්තිගරුක වෙමින්, ගීතය ගැයීම පමණක් නොව තමන්ද ගව මස් අනුභ වය නවතා, එතුමා එය ක්‍රියාවෙන්ද රටට ඔප්පුකර පෙන්වීය. මේ එතුමන්ගේ ගුණග රුකභාවය සපථ කළ එක් සිද්ධියක් පමණි.

එකල වුන් කපුගේ සූරීන්, ජෝතිපාලයන්, එම් එස් ප්‍රනාන්දු වැනි ජනතාව අතර සිටි ගායක යන් ගොන්නට නිහාල් නෙල්සන් නාමයද එක් වූයේ, එතුමන් පේමන්ට් එකේ, ගැලරියේ හෝ මුඩුක්කුවේ වෙසෙන ජනතාවට ගී ගැයූ නිසාය. ඔවුන්ව ඇසුරු කළ නිසාය. එලෙසම ඒ ගීත එතුමා ගැයුවේ මහා මන්දිරයක සඳලුතලයක් මතට වී නොවේ. පේමන්ට් එකේය. බජාර් එකේය. මුඩුක්කුවේය. මේ තැන්වලදී හමුවන්නේ දුප්පත් වුවත් එක වචනයක් ඇති කෙළින් වැඩකරන මිනිසුන් බව මමද අත්දැකීමෙන්ම දනිමි.

වරක් ඉරිදා පුවත් පතක ගීත වල ප්‍රමිතිය පිළිබඳ වාදයක් ඇරඹිණි. ප්‍රබුද්ධ ගීත හා බාල, අවර ගණයේ ගීතද ඒ අනුව ඒ ඒ ගීත ගයන ගායකයන්ද ප්‍රබුද්ධ හා අවර ගණයට වැටෙතැයි තර්ක කෙරිණි. මෙයට පිළිතුරු සැපයූ ජෝතිපාලයන් ඉතාම නිහතමානීව, ඔවුන් ප්‍රබුද්ධ නම් අපි පීචං යැයි පැවසීය. මෙයින් කිපුණු නිහාල් නෙල්සන් ගායන වේදියා ඊට පසු සතියේ ජෝතිපාලයන්ගේ අදහසට පිළිතුරක් සපයමින් ඉතාමත්ම රැ ඩිකල් අන්දමින් ඔවුන් ප්‍රබුද්ධ නම් අපි සුප්‍රබුද්ධ යැයි පැවසුවේ වාදය එතැනින්ම නිමාවට පත් කරවමිනි.

එමෙන්ම එතුමා අත හිත දී මැදිහත්ව ක්ෂේත්‍රයට හඳුන්වා දී නමක් තනා දුන් ශිල්පීන් රාශියකි. ඒ අතරින් මනරම් ගී පද රචකයකු හා ඉතා විශිෂ්ටගණයේ නිවේදක යකු බවට පත්වූ හේමසිරි හල්පිටයන් මේ අවස්ථාවේ සිහිපත් කළ යුතුමය. මෑතකදී ස්වාධීන රූපවාහිනියේ හල්පිටයන් ගුණ සැමරුම් වැඩසටහනකට සහභාගී වූ අපේ කතා නායකයා පැවසුවේ ඉතා සිත්ගන්නා සුළු අර්ථවත් යෙදුමකි. එනම් හල්පිටට පිල් හට ගන්නා තත්වයක් තමා නිර්මාණය කර දුන් බවයි. ඒ සඳහා තමන් සහ වර්නන් පෙරේරා නම්වූ තම අතිජාත මිත්‍රයා ඇප කැප වූ අන්දම එතුමන් තව දුරටත් විස්තර කළේ ඉතාමත්ම නිහතමා□වය.

එතුමන් වේග රිද්මයේ එහෙත් බෙහෝ අර්ථවත් වටිනා ගීත රාශියක් ගැයීය. බයිලා ගායක ශානරයට එතුමන් ඇතුළු වූවද එතුමාගේ හඬේ සහ ගීත ශෛලියේ වූයේ අමුතුම හැඩයකි. වෙනම වර්ණයකි. අනෙක් බයිලා ගායකයන් වූ එම් එස්, ඇන්ටන් ජෝන්ස්, පෝල් ප්‍රනාන්දු සහ සුනිල් පෙරේරා වන්නවුන්ට වඩා එතුමන්ගේ ගීත වෙනස්ම ආරක් ගත්තේ එහෙයිනි.

එතුමා ගායනා කරන කරුණා සුවඳ තවරාලු නම් වූ මව් ගුණ ගීතය අසා දෑස තෙත් කර නොගත් දරුවකු ලංකාවේ නොමැති බව මගේ විශ්වාසයයි. එය එතරම්ම හැඟුම්බරය. එහෙත් ඒවාට නිසි තැනක් ගෞරවයක් හෝ අගය කිරීමක් ලැබුනාදැයි සැක සහිතය.

මේ මොහොතේ මා ඉහත සඳහන් කළ සොමියට වරෙන් පුතා අගුල දාලා නෑ දොරේ ගීතය පිළිබඳව වරක් උපුල් ශාන්ත සන්නස්ගලයන් පැවසූ අපූරු විග්‍රයක් මට සිහිවේ. මේ ගීතයේ පද මාලාවේ ඇති ජීව ගුණය සහ විශිෂ්ටත්වය ගැන සඳහන් කළ එතුමා, මේ ගීතය ජනතාව වැළඳ ගත්තද සම්මානනීය ගීතයක් නොවූයේ මන්දැයි ප්‍රශ්න කළේය. මෙම ගීතය ලියූ හේමසිරි හල්පිටව මඳකට අමතකොට මෙය ලියූවේ මහගම සේකරයන් යැයි උපකල්පනය කොට සහ ගීතය ගයන නිහාල් නෙල්සන් වෙනුවට අමරදේවයන් ගයන්නේ යැයි උපකල්පනය කළහොත් මෙයත් ප්‍රබුද්ධ ගීයක් වෙනවා නොවේදැයි සන්නස්ගලයන් උත්ප්‍රාසයෙන් යුක්තව ප්‍රශ්න කළේය.

තවද එතුමා ගැයූ දහසකුත් ගීත අතර පත්තරවල විස්තර වල නම් වූ ගීතය, සල්ලි සල්ලි ලොකු ලොකු සල්ලි හා සල්ලි මිටි ගණන් අරගෙන එයි වටින් පිටින් නම් වූ ගීත වලට මම අතිශයෙන්ම පෙම් බැන්දෙමි. අඳින පළඳින විලාසයෙන්, කොණ්ඩ මෝස්තරයෙන්, අංග චලනයෙන් හා විශේෂයෙන්ම කට හඬින් කිසිදා වයසට නොයන මෙතුමා මේ අද වනවිටත් නව ගීත ගායනා කරයි. එහෙත් රූපවාහිනියේ හෝ අද වනවිට හතු පිපෙන්නාක් මෙන් බිහි වන දහසකුත් එකක් රේඩියෝ නාලිකාවල එතුමන්ගේ ගීත ප්‍රචාරය වනවාදැයි සැක සහිතය. ප්‍රසංග වේදිකාවේ නම් එතුමා ජනතාව අතර සිටිනා බව නොරහසකි. එහෙත් නව යොවුන් පරපුර එතුමන්ව දන්නවාද? හඳුනාගෙන තිබේද? එතුමන් ගැයූ ගීත පරිශීලනය කරනවාදැයි අවිශ්වාසය. එමෙන්ම නිහාල් නෙල්සන් යන නාමය කනට ඉඳ හිට හෝ ඇසෙන්නේම නැත. එහෙත් ඔහු තවමත් ජීවත් වන්නේය.

දැන් දැන්වත් අප ඔවුන් පිළිබඳව නැවත කතා කළ යුතු කාලය එළඹ ඇත. අප හරුන් ලන්ත්‍රාව අලුයම හෙළූ කෙළ පිඩක් පරිද්දෙන් අමතක කළෙමු. තිස්ස සිරි පෙරේරා වැනි සංගීතවේදීන් උන්නද මලාඳැයි වත් කියා නොබැලුවෙමු. දැන් ඇන්ජලින් ගුණතිලක ගායන වේදිණිය හැමටම අමතකය. සුජාතා අත්තනායක හා ලතා වල්පොල මැතිනිය ඉඳ හිට දකින්නට ලැබේ. ප්‍රියා සූරියසේන හා පුන්සිරි සොයිසා වැනි ගායකයන් හොර රහසේම වයසට යති. තවත් අය නම් බොහෝය. අප ඔවුනට නිසි ඇගැයීමක් දුන්නෙමුද? එය අපගේ හෘද සාක්ෂියෙන්ම ඇසිය යුතු පැනයකි.

මිය ගිය පසුව කිඹුල් කඳුළු හෙලනවාද නැතිනම් ජීවත්ව සිටියදීම ගුණ ගයනවාද? කෘතගුණ සළකනවාද? තීරණය ඇත්තේ අප අතමය. මේ පුංචි සටහන එලෙසින් ඉතා කඩිනමින් යොවුන් පරපුරට අමතකව යන නිහාල් නෙල්සන් නම් වූ බයිලා ගායකයා වෙනුවෙනි. ජනතාව අතර සිටිනා ඔහුගේ මනුස්සකම වෙනුවෙනි. අප පිනවූ අදටත් එලෙසින්ම පිනවන ඒ කට හඬට උපහාරයක් විලසිනි.




